1. පහත දක්වෙන ප්‍රකාශ සලකා බලන්න.
A - පාරිභෝගිකයාට ඔහු/ඇය තම නිවසේ හෝ කාර්යාලයේ සිටියදී ම සේවා ලබාගත හැකි වීම
B - සංසරණ නෝට්ටු භාවිතයෙන් තොරව ගෙවීම් කළ හැකි වීම
C - පාරිභෝගිකයා, විශාල ජාත්‍යන්තර සේවා සම්පාදක ජාදකයකට විවෘත වීම.
D - සේවා සම්පාදකයා විශාල ජාත්‍යන්තර පාරිභෝගික පාදකයකට විවෘත වීම.
E - ගෙවීම්වල ආරක්ෂාව සැමවිටම සහතික කරනු ලැබීම
සාම්ප්‍රදායික වාණිජ්‍යය හා සැසඳූ විට ඊ-වාණිජ්‍යයෙහි ඇති ප්‍රතිලාභ වන්නේ ඉහත දැක්වෙන කවර ඒවා ද?

(1) A, B හා C පමණි. (2) A, B හා D පමණි. (3) A, C හා D පමණි.
(4) A, B, C හා D පමණි. (5) B, C, D හා E පමණි. **(2011, Q 31)**

2. මාර්ගගත සේවා (Online services) පිළිබඳව පහත දක්වෙන ප්‍රකාශ සලකා බලන්න.
A - පාරිභෝගිකයාට මාර්ගගත සේවා ප්‍රවේශ හැකියාව තිබිය යුතු වීම.
B - පාරිභෝගිකයාට ගෙවීම් කිරීම සඳහා ඉලෙක්ට්‍රොනික යාන්ත්‍රණයක් තිබිය යුතු වීම.
C - කිසියම් භාණ්ඩයක් සඳහා ඇණවුම් කරන විටදී පාරිභෝගිකයාගේ අනන්‍යතාව තහවුරු කළ යුතු වීම.
D - සේවාදායකයා මාර්ගගත සේවා සැපයිය යුතු වීම.
E - පාරිභෝගිකයා සහ සේවාදායකයා යන දෙදෙනාම එකම භූගෝලීය ප්‍රදේශයක සිටිය යුතු වීම.
මාර්ගගත ඇණවුම්කදී (Online ordering) අත්‍යාවශ්‍ය වන්නේ කවරක් ද?
(1) A හා B පමණි. (2) A, B හා C පමණි (3) A, B හා D පමණි
(4) A, C, D හා E පමණි (5) B, D හා E පමණි. **(2011, Q 32)**

3. අන්තර්ජාලය පිළිබඳව පහත දක්වෙන ප්‍රකාශ සලකන්න.
A - අන්තර්ජාලය යනු ජාලවල ගෝලීය ජාලයකි.
B - අන්තර්ජාලය හා සම්බන්ධ වන පුද්ගලයන්ට හා සංවිධානවලට අන්තර්ජාලයේ හවුලේ පරිහරණය කරනු ලබන විශාල තොරතුරු ගබඩාවට ප්‍රවේශ විය හැකිය.
C - W3C යනු අන්තර්ජාලයේ භාරකාරත්වයයි.
D - දත්ත බාගත හැක්කේ File Transfer Protocol (ETP) මඟින් පමණි.
E - ඕනෑම අයෙකුට අන්තර්ජාලයෙහි තොරතුරු ප්‍රසිද්ධියට පත් කිරීමට හෝ නව සේවා නිර්මාණය කිරීමට හෝ හැකි වේ.
ඉහත ඒවා අතුරෙන් කවර ප්‍රකාශ නිවැරදි වේ ද?
(1) A, B හා D පමණි. (2) A, B හා E පමණි (3) A, D හා E පමණි.
(4) B, C හා D පමණි (5) B, C හා E පමණි. **(2011, Q 36)**

4. විදේශ රටක රැකියාවක නියුතු පුද්ගලයෙක්, ශ්‍රී ලංකාවේ වෙසෙන සිය මවට යම් සමාගමක වෙබ් පාදක (web-based) සේවා උපයෝගී කර ගනිමින් උපන් දින කෑෂයක් ලැබෙන්නට සැලැස්වීම සඳහා මාර්ගගත (online) ඇණවුමක් කරයි. උපන් දින කෑෂය ඇනවුම් කිරීමේ මෙම ගනුදෙනුව වඩාත්ම හොඳින් වර්ගීකරණය කළ හැක්කේ,
(1) පාරිභෝගිකයාගෙන් සුළු වෙළෙන්දාට (Retailer) ලෙස ය. (2) පාරිභෝගිකයාගෙන් ව්‍යාපාරයට ලෙස ය.
(3) ව්‍යාපාරයෙන් පාරිභෝගිකයාට ලෙස ය. (4) ව්‍යාපාරයෙන් ව්‍යාපාරයට ලෙස ය.
(5) සේවකයාගෙන් ව්‍යාපාරයට ලෙස ය. **(2012, Q 30)**

5. "විඩියෝ සම්ප්‍රේෂණ පැවැත්වීම (Video conferencing) යන්න, විවිධ ස්ථානවල සිටින දෙදෙනෙකු හෝ කිහිප දෙනෙකු අතර ..... හරහා සිදුවන ..... සාකච්ඡාවක් ලෙස වඩාත් හොඳින් විස්තර කෙරේ."
ඉහත ප්‍රකාශයෙහි හිස්තැන් පිරවීම සඳහා පිළිවෙළින් වඩාත් සුදුසු පිළිතුරු වන්නේ පහත දක්වෙන කවර පද යුගලය ද?
(1) රූපවාහිනියක්, විඩියෝ (2) දුරකථනයක්, ශ්‍රව්‍ය (3) ජාලයක්, ශ්‍රව්‍ය
(4) රූපවාහිනියෙන්, ශ්‍රව්‍යදෘශ්‍ය (5) ජාලයක්, ශ්‍රව්‍යදෘශ්‍ය **(2012, Q 35)**

6. ව්‍යාපාරයකට සම්බන්ධ පහත දක්වෙන උප ලක්ෂණ (attributes) සලකන්න.
A - සේවා සැපයුමේ වේගය
B - මිල දී ගැනීම් සහ බෙදා හැරීම
C - යැවුණු භාණ්ඩවල ආරක්ෂාව
D - ඉල්ලුම් කරන ලද අයිතමවල ගුණාත්මකභාවය පිළිබඳ විශ්වාසනීයභාවය (confidence)
E - ව්‍යාපාරවල දී අවාසි/අවාසියක් වන්නේ ඉහත සඳහන් දෑ අතුරින්
(1) A පමණි (2) C පමණි (3) A හා B පමණි
(4) C හා D පමණි (5) A, B, C හා D යන සියල්ලම **(2013, Q 22)**

7. ෆේස්බුක් (facebook) යනු, දිනපතා නව සාමාජිකයන් එකතු වන, මිලියන ගණනක් ජනතාව සම්බන්ධ කරන ජනප්‍රිය සමාජ ජාලයකි. පහත වගන්ති අතුරෙන් කවරක් සත්‍ය වන්නේ ද?
(1) ඔබේ පවුල් සම්බන්ධතා ගොඩනැගීමට හා පවත්වාගෙන යාම සඳහා ෆේස්බුක් ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.
(2) අද පවතින එකම සමාජ ජාලය ෆේස් බුක් වේ.
(3) ෆේස්බුස් තුළ පවතින පෞද්ගලිකත්වය සකස් කිරීම (setting) මඟින් එහි පරිශීලකයන්ගේ පෞද්ගලිකත්වය පූර්ණ ලෙස සහතික කරයි.
(4) පෞද්ගලික තොරතුරු ෆේස්බුක් තුළ ප්‍රකාශයට පත් කිරීම තුළින් අවාසනාවන්ත සිද්ධීන් හටගෙන ඇත.
(5) ෆේස්බුක් තුළ පුද්ගලයෙකුගේ සැබෑ අනන්‍යතාව සෑම විට ම සහතික කර ඇත. **(2014, Q 21)**

8. පහත සඳහන් කුමන වගන්තිය සත්‍ය වන්නේ ද?
(1) පරිගණක පාදක ඉගෙනුම් යනු ගුරු දිශාභිමුඛ ඉගෙනුම් ක්‍රමවේදයකි.
(2) ස්කයිප් (skype) යනු ප්‍රසිද්ධ වීඩියෝ සම්මන්ත්‍රණ (video conferencing) සේ සැලකිය හැකි ය.
(3) අතරාත්‍ය රූපී පුද්ගලික ජාල (VPN) ටෙලි කොම්නිය (telecommuting) සඳහා මාධ්‍යයක් සපයයි.
(4) මාර්ග අපගත (offline) විභාග පැවැත්වීම පරිගණක සහකාරක ඇගයීම් (computer aided assessments) සේ සැලකිය හැකි ය.
(5) මයික්‍රොසොෆ්ට් පවර් පොයින්ට් යනු පරිගණක පාදක සමර්පන සඳහා නිදහස් හා විවෘත ප්‍රභව මෘදුකාංගයකි. (FOSS)
(2014, Q 22)

9. පහත සඳහන් කුමන වගන්තිය සත්‍ය වන්නේ ද?
(1) www.ebay.com යනු C2C සඳහා උදාහරණයකි.
(2) රජය ඔවුන්ගේ සේවා ලෝක විසිරි වියමන (www) හරහා ජනකාව වෙත ලබාදීම B2C ලෙස හැඳින්වේ.
(3) www.application යනු B2E සඳහා උදාහරණයකි.
(4) www.amazon.com යනු B2E සඳහා උදාහරණයකි.
(5) ෆේස්බුක් (Facebook) හි කණ්ඩායම් (සමූහ) E2C සඳහා උදාහරණ වේ. **(2014, Q 24)**

10. සමාජ ජාල අඩවි සම්බන්ධයෙන් පහත දක්වා ඇති වගන්ති සලකා බලන්න.
A ඡන්ද ප්‍රචාරක වැඩසටහන් සඳහා මාධ්‍යයක් ලෙස මේවායෙහි භාවිතය වැඩිවෙමින් පවතී.
B සමාජ ජාල අඩවියක් තුළ දී පරිශීලකයකුගේ සැබෑ අනන්‍යතාව සැමවිට ම සහතික කරනු ලැබේ.
C නවීන සමාජය තුළ මානව සම්බන්ධතා පවත්වා ගැනීම සඳහා මෙම සමාජ වෙබ් අඩවි උදක්ව අවශ්‍ය වේ.
ඉහත සඳහන් වගන්ති අතුරෙන් නිවැරදි වන්නේ,
(A) A පමණි (2) B පමණි (3) C පමණි (4) A හා B පමණි (5) A හා C පමණි **(2015, Q 10)**

11. ශ්‍රී ලංකාවෙහි සමහර පළාත්වල රථවාහන සඳහා ආදායම් බලපත්‍ර මාර්ගගතව (online) ලබාදෙයි. මෙම සේවාව සඳහා නිවැරදි ව්‍යාපාර වර්ගය පහත සඳහන් දෑ අතුරෙන් කුමක් ද?
(1) B2C (2) B2B (3) C2B
(4) B2E (5) G2C **(2015, Q 14)**

12. ABC හෝල්ඩින්ග්ස් යන ශ්‍රී ලාංකික නිෂ්පාදන සමාගමේ ප්‍රධාන කාර්යාලය ජපානයෙහි පිහිටා ඇත. ජපානයේ සිටින ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්ව කණ්ඩායම හා ශ්‍රී ලංකාවේ සිටින දේශීය කාර්ය මණ්ඩලය අතර සතිපතා ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම සඳහා භාවිතයට වඩාත් ම පහසු ක්‍රමය වන්නේ කුමක් ද?
(1) දුරකථන ඇමතුම් (2) ස්කයිප් (Skype) (3) විද්‍යුත් තැපෑල
(4) කෙටි පණිවිඩ (SMS) (5) යූටියුබ් (YouTube) භාවිතය. **(2015, Q 27)**

13. විද්‍යුත් වාණිජ්‍යය (e-commerce) සම්බන්ධයෙන් සත්‍ය වන්නේ පහත සඳහන් කවරක් ද?
(1) එය විද්‍යුත් ව්‍යාපාරවල (e-business) කොටසක් විය හැකි ය.
(2) එය බහුවිධ ව්‍යාපාර ක්‍රියාවලි තනි තොරතුරු පද්ධතියකට ඒකාබද්ධ කිරීමට උදව් කරයි.
(3) එය ව්‍යාපාර සහ ඒවායේ පාරිභෝගිකයන් හට අන්තර්ක්‍රියා කිරීම සඳහා සකසා ඇති වේදිකා (platforms) සමූහයකි.
(4) www.google.com යනු ජනප්‍රිය විද්‍යුත් වාණිජ්‍යය වෙබ් අඩවියකි.
(5) විද්‍යුත් වාණිජ්‍යය සිදු කරනු ලබන ශ්‍රී ලාංකික සමාගම් දැනට නොමැත. **(2016, Q 14)**

14. "නවීන සංවිධානවල සේවකයන් නිවසේ සිට ඔවුන්ගේ රාජකාරී ඉටු කරයි"
ඉහත වගන්තිය වඩාත් හොඳින් විස්තර කරනුයේ පහත කවරකින් ද?
(1) සමාජ ජාලකරණය (Social networking) (2) ටෙලිගමනය (Telecommuting)
(3) ක්ෂණික පණිවිඩ යැවුම් (Instant messaging) (4) කාර්යාල ස්වයංකරණය (office automation)
(5) බ්ලොග් රචනය (Blogging) **(2016, Q 27)**

15. විද්‍යුත් ව්‍යාපාර (e-business) සම්බන්ධයෙන් පහත දක්වෙන කුමන වගන්තිය සත්‍ය වේ ද?
(1) එය අර්ථ වශයෙන් මාර්ගගතව පවත්වාගෙන යන ව්‍යාපාර ක්‍රියාවලියකි.
(2) එය පෙර අන්ත (front-end) සහ පසු අන්ත (back-end) මාර්ගගත ක්‍රියාවලීන් සමන්විත වේ.
(3) සියලු 'brick' ව්‍යාපාරිකයින් ඔවුන්ගේ ව්‍යාපාර මාර්ගගතව පවත්වයි.
(4) ඕනෑම විද්‍යුත් වාණිජ්‍ය යෙදුමක් විද්‍යුත් ව්‍යාපාර යෙදුමකි.
(5) ඕනෑම විද්‍යුත් ව්‍යාපාර යෙදුමක් විද්‍යුත් වාණිජ්‍ය යෙදුමකි. **(2017, Q 26)**

16. ඉ-ව්‍යාපාර සම්බන්ධ පහත ප්‍රකාශ සලකන්න.
A - බ්‍රික් හා ක්ලික් (brick-and-click)) යනු යම් සමාගමකට මාර්ගගත නොවන (offline) හා මාර්ගගත (online) යන දෙක එකට එකතු කර ව්‍යාපාරය පවත්වාගෙන යා හැකි ව්‍යාපාර ආකෘතියකි (business model).
B - පියෝ බ්‍රික් (pure-brick) යනු යම් සමාගමකට භෞතික පැවැත්මක් පමණක් ඇති ව්‍යාපාර ආකෘතියකි.
C - පියෝ ක්ලික් (pure-click) ව්‍යාපාරවලට අන්තර්ජාලය මත පමණක් පැවැත්මක් ඇත.
ව්‍යාපාර ආකෘති සම්බන්ධයෙන් ඉහත කවර වගන්ති/යක් නිවැරදි වේ ද?
(1) A පමණි (2) B පමණි (3) C පමණි
(4) A හා C පමණි (5) A, B හා C සියල්ලම් **(2018, Q 31)**

17. පහත සඳහන් කවර ප්‍රකාශයක් සත්‍ය වේ ද?
(1) YouTube යනු B2C සේවාවක අන්තර්ගතය සපයන්නෙකු (content provider) වේ.
(2) Google.com යනු B2C සේවාවක වෙබ් ද්වාරයක් (web portal) සඳහා උදාහරණයකි.
(3) ebay.com යනු C2B සේවාව සඳහා උදාහරණයකි.
(4) e-බැංකුකරණ සේවාව යනු B2C සේවාව යටතේ තොරතුරු තැරැව්කරුවන් වේ.
(5) doenets.lk යනු B2C සේවාව සඳහා වූ උදාහරණයකි. ***(Prototype Paper 2019, Q 43)***

18. SEO මගින් ප්‍රකාශ වනුයේ,

1) Search Entity Organisation 2) Search Engine Optimisation 3) Secure Engine Organisation
4) Secure Engine Optimisation 5) Search Electronic Organically ***(Model Paper)***

19. ඩිජිටල් ආර්ථිකයේ (digital economy) නොමැති වෙළඳ සමාගම් වර්ගයක් වනුයේ,

1) Pure brick 2) Brick and click 3) Pure click
4) Pure Play 5) Pure Pal ***(Model Paper)***

20. විද්‍යුත්-වාණිජකරණයේ (e-commerce) නව ප්‍රවණතාවයක් නොවනුයේ,

1) සමාජ මාධ්‍යය (social media) 2) ජංගම දුරකථන ඔස්සේ අලෙවි කිරීම් 3) අන්තර්ජාල වෙළඳසැල්
4) අතථ්‍ය ප්‍රජාව (virtual community) 5) ඉහත කිසිවක් නොවේ ***(Model Paper)***

21. e-වාණිජ්‍යයට සම්බන්ධ පහත දැක්වෙන ක්‍රියාවලි සලකන්න.

A - සපත්තු යුගලක් මාර්ගගතව මිලදී ගැනීම
B - ඔබගේ ප්‍රියතම නවකතාවෙහි ඉලෙක්ට්‍රොනික පිටපතක් (e-book) මාර්ගගතව මිලදී ගැනීම
C - ඔබගේ නිවසේ සිට ගුවන්තොටුපොළ වෙත යෑමට කුලී රථයක් මාර්ගගතව වෙන් කරගැනීම

ඉහත ක්‍රියාවලි අතුරෙන් කවරක් පියෝ-ක්ලික් *(pure-click)* ව්‍යාපාර ආකෘතිය නිරූපණය කරයි ද?

1) A පමණි 2) B පමණි 3) C පමණි 4) A සහ C පමණි 5) B සහ C පමණි ***(2019, Q 5)***